# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1968/7 - 2016 මැයි මස 24 වැනි අඟහරුවාදා - 2016.05.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය :* ගානා/4/5/අත්පත්/83
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය : - 4-3/15/2012/වි‍ර්/286

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන *ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන *ඉඩමේ/පරවශතාවේ විස්තරය:-*

ගාල්ල දිස්ත්‍රික්කයේ, ගඟබඩ පත්තුව උතුර - නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 219 ඩී, අලුත් වත්ත ග්‍රාම නිලධාරී වසමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක අ.ග.පි. 528, පත්‍ර අංක 97, අතිරේක 94 දරන පිඹුරේ දක්වා ඇති පහත විස්තර වන ඉඩම් කැබැලි 06 සම්බන්ධයෙනි.

1. කැබලි අංක 1614
ඉඩමේ නම: නාකියාදෙනිය වත්ත; විස්තරය: ගෙවත්ත,අවු. 20-25 ක් පමණ වයසැති කටුපොල් ගස් 10ක්, ඇටඹ ගසත්, ස්ථිර ගොඩනැගිලි 3ක කොටස් සහ ස්ථිර දෙමහල් ගොඩනැගිල්ලක් ඇත. හිමිකම් ඉදිරිපත් කරන්නාගේ නම: රජය, ප්‍රමාණය: හෙක්. 0.1212.

2. කැබලි අංක 1615
ඉඩමේ නම: — විස්තරය: ගෙවත්ත,ස්ථිර ගොඩනැගිලි 4ක කොටස් ඇත. හිමිකම් ඉදිරිපත් කරන්නාගේ නම: රජය ප්‍රමාණය: හෙක්. 0.0085.

3. කැබලි අංක 1616
ඉඩමේ නම: නාකියාදෙනිය වත්ත; විස්තරය: ගෙවත්ත,අවු. 20-25 ක් පමණ වයසැති කටුපොල් ගස්, ස්ථිර ගොඩනැගිලි 3ක කොටස් සහ තාවකාලික ගොඩනැගිල්ලක් ඇත. හිමිකම් ඉදිරිපත් කරන්නාගේ නම: රජය, ප්‍රමාණය: හෙක්. 0.1044.

4. කැබලි අංක 1617
ඉඩමේ නම: — විස්තරය: දොල, හිමිකම් ඉදිරිපත් කරන්නාගේ නම: රජය, ප්‍රමාණය: හෙක්. 0.0513.

5.කැබලි අංක 1618
ඉඩමේ නම: නාකියාදෙනිය වත්ත; විස්තරය: ගෙවත්ත,අවු. 20-25 ක් පමණ වයසැති කොස් ගසක්, ගම් දෙල් ගසක්, කටුපොල් ගස් 11 ක් හා ළිඳක් ඇත. හිමිකම් ඉදිරිපත් කරන්නාගේ නම: රජය, ප්‍රමාණය: හෙක්. 0.1274.

6.කැබලි අංක 1619
ඉඩමේ නම: නාකියාදෙනිය වත්ත; විස්තරය: ගෙවත්ත,අවු. 20-25 ක් පමණ වයසැති ගොඩපර ගසක්, කැකුණ ගස් දෙකක් සහ කටුපොල් ගස් 11 ක් ඇත. හිමිකම් ඉදිරිපත් කරන්නාගේ නම: රජය ප්‍රමාණය: හෙක්. 0.1235.

ඉහත සඳහන් *ඉඩමට/පරවශතාවට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම, තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 ජුනි 29 වැනි දින පූ.භා. 10.30ට, නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2016 ජුනි 01 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී *ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ශානික ත්‍රිමාන්න,
ප්‍රාදේශීය ලේකම්,
නාගොඩ කොට්ඨාසය.

2016 අප්‍රේල් මස 04 වැනි දින,
නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

06 - 219

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.